# තාරුණ්‍යයේ ගැහැනු අපේක්ෂාව

වර්තමාන තාරුණ්‍යය විමර්ශනාත්මකය. නිර්මාණශීලි චින්තනයකින් හෙබි තාරුණ්‍යය ශ්‍රී ලංකාවේ අනාගත බාරකරුවන්ය. එයින් අතිබහුතරය මෙන්ම සමස්ත ජනගහනයෙන් 53%ක් ද කාන්තාවෝය. අන් කවර කලෙකටත් වඩා තරුණ කාන්තාවන් ස්වකීය අයිතිවාසිකම් දිනා ගැනීම කෙරෙහිත් දේශපාලනික මැදිහත්වීම් කෙරෙහිත් දක්වන ක්‍රියාකාරී උවමනාව විසින් පෙන්නුම් කෙරෙනුයේ එළැඹෙමින් තිබෙන පරිවර්තනීය යුගයක ආරම්භයකි.

නැවත වතාවක් අප සිටින්නේ ජනාධිපතිවරණයක් අභියසය. මෙවර ජනාධිපතිවරණය වඩා සුවිශේෂි වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රබල කතිකාවක් සමාජය තුළ මුල්බැසගෙන තිබියදී රටේ අනාගත නායකයෙකු තෝරා පත්කර ගැනීමට නියමිතව තිබෙන නිසාය. ප්‍රජාතන්ත්‍රවාදය සුරකින නායකයෙක් තෝරාගත යුතුය යන හඬක් සමාජය තුළ ඉස්මතුව තිබේ.

මෙවැනි සමාජ දේශපාලනික වාතාවරණයක විශේෂයෙන් තරුණ කාන්තා ජනගහනය ප්‍රජාතන්ත්‍රවාදය දකින්නේ කෙසේද? ළඟ එන ජනාධිපතිවරණය ඔවුන්ගේ ප්‍රාර්ථනා සඵල කර ගන්නට යොද ගන්නේ කෙසේද? යන්න පිළිබඳ කාන්තා නියැදියක් ඔස්සේ අප විමසා බැලීමු.

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ තරුණ මන්ත්‍රිනියක වන හර්ෂණී ගුණසේකර**ගෙන් අප මේ පිළිබඳ විමසුවෙමු.

"ප්‍රජාතන්ත්‍රවාදය යනු ප්‍රජාව විසින් ප්‍රජාව පාලනය කරනු ලැබීම නම් අපි අපේ නායකයා ලෙස තෝරා ගන්න ඕන අපේ හඬ ක්‍රියාත්මක කළ හැකි නායකයෙක්. ඔහු හෝ ඇය සමස්ත ජනතාවගේ නායකයා විය යුතුයි. විශේෂයෙන්ම තාරුණ්‍යයේ හඬට කන්දෙන නායකයෙක් විය යුතුයි. මේ ගැන අවබෝධයෙන් අප හරිදේ තීරණය කළ යුතුයි."

ජනාධිපතිවරණයට ඉදිරිපත්ව සිටින අපේක්ෂක/අපේක්ෂිකාවන් අතුරින් ඒ තෝරා ගැනීම කිරීමට අපට සිදුවනු ඇත. ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශ මෙන්ම ඔවුන්ගේ අදහස් හා මත පිළිබඳව ද අප අපගේ අවධානය තබා ගත යුත්තේ අප අපේක්ෂා කරන නායකයා කවුරුන්දැයි තෝරා ගැනීමට බව ඇයගේ අදහසයි.

**ගම්පොළ ප්‍රදේශයේ නිරෝෂා ජයසේකර** දේශපාලනය පිළිබඳ උනන්දුවක් දක්වන තරුණියකි. "අපිට අපේ නිදහස් මතයක් එළියට දමන්න විශේෂයෙන් කාන්තාවන් විදියට හැකියාවක් නැහැ. මුහුණුපොත වැනි සමාජ මාධ්‍යවලින් අපේ ස්වාධීන මතයක් එළියට දැමූ ගමන් ඊට ප්‍රතිවිරුද්ධ අදහස් දරන්නන් එන්නේ අවි අමෝරාගෙන. ඉතාමත්ම අසභ්‍ය වචනවලින් දමල ගහන සිරිතක් තිබෙනවා. මේක මේ සමාජ ක්‍රමයෙම වරදක්".

"2015න් පස්සේ මේ තත්ත්වය තරමක් වෙනස්වුණා. ඒ වුණාට සියයට සියයක් නෙවෙයි. අපට ඕනේ යම් විදියකට රටේ ගොඩනැගුණ ප්‍රජාතන්ත්‍රවාදය තවත් ඉදිරියට ගෙනයන්න. එයට සහය දෙන අපේක්ෂකයෙක් අපි තෝරාගත යුතුයි. ඒක හරියට ආලෝකයෙන් ආලෝකයට යනවා වගේ, ප්‍රජාතන්ත්‍රවාදයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට යනවා වගේ දෙයක්".

මන්නාරමේ සිට කොළඹ පැමිණ, මෙවර **උසස් පෙළ විභාග යට පෙනී සිටි සිසුවියක වන අනිතා රාජනාදන්** අප හා මෙසේ කීවාය.

"මම ද්‍රවිඩ තරුණියක් හැටියට අදහස් දක්වන්නේ. අපට ප්‍රශ්න තිබෙනවා. ඒවා දේශපාලකයන් ඇති කළ ප්‍රශ්න විදියටයි මම දකින්නේ. ඇත්තටම මම හිතන්නේ අපේ රට වාර්ගික ප්‍රශ්නයක් නොතිබුණු රටක්. තමන්ගේ වාසියට මේ රටට නැති වාර්ගික අර්බුදයක් ඇදල දැම්මා. එහෙම කළේ පාලකයන්ට බෙදා වෙන්කර පාලනය පහසු කරගන්නයි.

මේ තත්ත්වය වෙනස්විය යුතුයි. මෙවර ජනාධිපතිවරණයේ ඒකට තිබෙන අවස්ථාවයි අපි බැලිය යුතු. මම කියන්න කැමතියි අපි ඡන්දය දෙන්නෙ උතුරත් දකුණත් එකසේ සලකලා සමානාත්මතාවයෙන් කටයුතු කරන්න සූදානම් අපේක්ෂයකුටයි. එවැනි අපේක්ෂකයෙක් වංචා දූෂණ චෝදනා නැති අපේක්ෂකයකු වීම කෙරෙහිත් මගේ අවධානය යොමුවෙනවා".

"නැගෙනහිර පළාතේ වැන්දඹුවන් අතිවිශාල ප්‍රමාණයක් ජීවත්වෙනවා. ඔවුන් අතිබහුතරයක් තරුණ කාන්තාවන්. ඉදිරි දේශපාලන වෙනස්වීම්වලදී මේ අය වෙනුවෙන් යමක් සිදුවෙයි කියල මම බලාපොරොත්තු වෙනවා. මේ කාන්තාවන් සවිබල ගැන්වීම අවශ්‍යයයි. පාරවල්, පාලම්, ගොඩනැගිලි හදල වැඩක් නැහැ. ඒවාට කලින් මිනිස්සුන්ගේ බඩගින්න ගැන හිතන්න ඕන. මම එයින් අදහස් කරන්නෙ ආහාර වේලක් දීම නොවෙයි. අර කතාවක් තියෙනවා මාළුවෙක් දෙනවට වඩා බිලී පිත්තක් දෙන එක බඩගින්නට හොඳ විසඳුමක් කියලා. අපේ බලාපොරොත්තුව වෙන්නේ අන්න ඒ වගේ ඉදිරිගාමී වැඩපිළිවෙලක් ඇති නායකයෙක්" යැයි නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක, **සමාජ පරිවර්තනයක් සඳහා වන කාන්තා සංවිධානයේ නියෝජිතවරියක වන රොහිනා මහරූෆ්** දරන්නේ එවැනි අදහසකි.

"එහි දී අපි තවත් නිර්නායකයක් භාවිත කරනවා. නිදහස භුක්ති විඳින්නට අපට ඇති අවස්ථාව ගැන අපි හිතනවා. ඒ නිසා නිදහසේ ගමන් බිමන් යන්න, නිදහසේ හුස්ම ගන්න හැකි පරිසරයක් හදන අපේක්ෂකයාට අපේ ඡන්දය හිමිවෙනවා" යැයි ඇය වැඩිදුරටත් පැවසුවාය.

**රජයේ විශ්වවිද්‍යාලයක උපාධිධාරි තරුණියක වන ගාල්ලේ, බුද්ධි දිසානායක** මෙසේ කියන්නීය.

"මම අනූව දශකයේ උපන් කෙනෙක්. මගේ ජීවිත කාලයෙන් මට තේරෙන වයසේ, ඒ කියන්නෙ ගෙවුණු අවුරුදු දහයක් විතර කාලය තුළ අපේ රටේ දේශපාලනය මම අත්වින්දා. ඉතින් මම සමාජයෙන් බලාපෙරොත්තු වෙන්නෙ මොනවාද කියල ඇහුවොත්, ඇත්තටම රාජ්‍යයෙන් සිදුවියයුතු සුභසාධනය සිදුවන්නේ නැහැ. පොරොන්දු දුන්නට ඒවා ඉටුවන විදියේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් අවශ්‍යයි. ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවන විදියේ විශේෂයෙන් අපේ රටේ කාන්තාවන් දිරිගන්වන විදියේ වැඩපිළිවෙලක් අවශ්‍යයි. අධ්‍යාපනය සඳහා වන දිරිගැන්වීම් සහ පහසුකම් අවශ්‍යයි.

අධ්‍යාපනයට සෞඛ්‍යට ස්ථිර ප්‍රතිපත්තියක් නැහැ. පාලකයන් මාරුවෙනකොට ඒවා මාරුවෙනවා. ඒ නිසා ස්ථිර ප්‍රතිපත්තියක් මේ සම්බන්ධයෙන් තිබිය යුතුයි. අද පාසල්වල දරුවන්ගේ දක්ෂතා දියුණු කරන ක්‍රමයක් වෙනුවට දක්ෂතා මොටකරන ක්‍රමයක් තියෙන්නෙ. තරුණ අපි හිතන්නෙ මේ රටින් පිටවෙන ක්‍රමයක් ගැන. මොකද අපිට අපේ හෙට දවස මේ රට ඇතුළේ පෙන්නන්න පාලකයෝ අසමත්වෙලා තිබෙනවා. මේ මැතිවරණයේදී මේවා ගැන හිතල හරි අපේක්ෂකයෙක්ට මේ රට බාරදෙන්න මිනිස්සු වැඩකරන්න ඕන" යැයි බුද්ධි අප හා පැවසුවාය.

"ඇත්තටම අපිට ඕන නිදහස. වතුකරයේ දෙමළ ජනතාව කියන්නේ ඉතාම පීඩිත කොටසක්. ඔවුන් ආර්ථිකව දුර්වලයි. මේ ප්‍රජාව පාවිච්චි වුණේ හැමදාම පාලකයෝ බලයට ගේන්න ඕන වුනාම කතිරේ ගහගන්න විතරයි. තවදුරටත් ඔවුන් රැවටීමට ලක් වියයුතු නැහැ. ඔවුන් මිනිස් කොට්ඨාසයක් සේ සලකලා ඒ අයගේ අයිතීන් සුරක්ෂිත කරන නායකයෙක් වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරන්න කියල මම ඉල්ලනවා" යැයි **පාසල් ගුරුවරියක වන බදුල්ලේ, ජෙයරාණි වසන්තා** පවසයි.

**මතුගම ප්‍රදේශයේ ස්වයං රැකියාවක නිරත වන ගෘහණියක වන මල්කා වීරසිංහ** මේ පිළිබඳ කළ විමසීමේදී කියාසිටියේ. "මම කැමතියි කාන්තාවගේ පාර්ශ්වයෙන් යමක් කියන්න. මේ රටේ වනිතා කටයුතු අමාත්‍යාංශය අක්‍රීය වෙලා තියෙන්නෙ. කෝ කාන්තා කටයුතු ඇමතිනිය. එහෙම කෙනෙක් ඉන්නවා ද දන්නේ නැහැ. අපි වගේ කාන්තාවන් සවිබල ගැන්වීමෙන් කොයි තරම් දේ මේ රටට ගන්න පුළුවන්ද? අපනයන දිරිගන්වන්න මොනවද තියෙන වැඩපිළිවෙළ? ගෘහ සේවිකාවන් රට යැවීම නතර කරල ඔවුන් ලංකාවේ තියාගෙන ඔවුන් ව්‍යවසායකයන් කරල නිෂ්පාදන හා සේවා විනිමය උපයන්න යොදා ගන්න කාටද උවමනාවක් තියෙන්නෙ? ගෘහ සේවයට දියවෙන්නේ මේ රටේ තරුණ ශක්තිය. කාටද ඒ ශක්තිය මේ රටේ තියා ගන්න උවමනාවක් තියෙන්නෙ?" ඇය ප්‍රශ්න කරන්නීය.

"කාන්තා ඇමතිනිය අවුරුද්දකට වතාවක් කාන්තා දිනයේදී පෙනී ඉන්නවා මාධ්‍ය ඉස්සරහ. කාන්තා කටයුතු අමාත්‍යාංශය කියන්නෙ කාට හරි නිකන් දෙන අමාත්‍යාංශයක් වෙලා. ඇයි මෙහෙම වෙන්නෙ? මේ රටේ ජනගහනයෙන් අඩකට වඩා ඉන්නෙ කාන්තාවෝ. මෙන්න මේ කාන්තාවන් ගැන හිතන ඔවුන්ගේ ඇත්ත ප්‍රශ්න තේරෙන නායකයෙකුට අප ඡන්දය දෙනවා." ■

WMC
කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective

■ අනුග්‍රහය - **කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය** නො. 56/1, සරසවි පටුමග, කාසල් වීදිය, කොළඹ 8. දුරකථන: 011-2690201; ෆැක්ස්: 0112690191/2690201